# 2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## සරණංකර-538 C



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 538 C - සරණංකර

# ග්‍රාම සංවර්ධන සැලැස්ම



ආර්ථික සංවර්ධන නිලධාරී

චානක රුවන් රාජපක්ෂ මහතා

පටුන

පිටු අංක


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | 01 |
| 2. | සරණංකර වසමේ සිතියම | 02 |
| 3. | යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම | 03 |
| 4. | වැසිකිලි හා අපජල පද්ධතිය නවීකරණය | 04 |
| 5. | බහුකාර්ය සේවා පියසක් ස්ථාපිත කිරීම | 05 |
| 6. | සමාජ සංවර්ධන සැලැස්ම | 06 |
| 7. | මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නිවාරණය | 06 |
| 8. | දරුවන්ගේ අධ්‍යාපන ගැටළු | 07 |
| 9. | පදිංචි ඔප්පු සම්බන්ධ ගැටළු | 08 |
| 10. | ළමා පෝෂණය හා සෞඛ්‍යය | 09 |
| 11. | ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය | 10 |
| 12. | පරිසර කළමණාකරණය හා ආපදා කළමණාකරන සැලැස්ම | 10 |
| 13. | ගංවතුරමය ආපදා තත්ත්වය | 11-12 |
| 14. | ඩෙංගු මදුරු උවදුර | 13 |
| 15. | ජීවන උපාය සංවර්ධන සැලැස්ම හා ව්‍යවසාය සංවර්ධන සැලැස්ම | 13-14 |
| 16. | කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම | 15 |
| 17. | නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම | 16 |

## 01.හැඳින්වීම

සරණංකර වසමට දකුණින් ගල්වල වසම ද, නැගෙනහිරින් හත් බෝධිය වසමද විලවල වසමට මායිම්ව හා ඉතා සමීපවද පිහිටා ඇත, සරණංකර පාර කිලෝ මීටරයකටත් වඩා දිගකින් යුක්තවූ මගින් උදෙසා පොදු මගි බස්රථ සේවාවක් ධාවනය කල යුතු මාවතක් වුවද එසේ මගි බස් ප්‍රවාහන සේවයක් කොමැති කමින් සාමාන්‍ය මිනිසුන් කුලී රථවලට විශාල පිරිවැයක් දරමින් ගමනාගමනයේ යෙදෙන අතර, පොදු බස් රථ සේවාවක අවශ්‍යතාවය විසදිය යුතුය.

සරණංකර වසමේ විශාලත්වය වර්ගි කිලෝමීටර් දශම හතරයි හයකි. සරණංකර වසම අයත් වන වීදි ගණනාවකි. ශ්‍රී සරණංකර පාර, හත්බෝධිය පාර. ගෞඩර් පෙදෙස, ජුලියන් පෙදෙස, භාතිය මාවත, ශ්‍රී මහා විහාර පාර, පාසැල් මාවත. විමලසාර පාර, බණ්ඩාරනායක මාවත, නෙළුම් මාවත, ක්‍රීඩා මාවත, රාහුල මාවත, ගුණාලංකාර පාර, යශෝධරා පාර, බෝධිරුක්ඛාරාම පාර, සරණංකර ටෙරන්ස්, සරණංකර පාත් සරණංකර වසමට අයත්වන වීදින්ය .

ජාතින් අනුව සරණංකර වසම තුල ජන ගහණය මෙසේ පෙල ගැස්විය හැකිය. සිංහල 4516, දෙමළ 598, මුස්ලිම් 1318, බර්ගර් 124, මැලේ 183 හා වෙනත් ජාතින් 55 කි. පවුල් 1989 ක් පමණ වෙසෙති. ස්ත්‍රීන් 3406 ක්ද, පුරුෂයන් 3388 ක්ද වෙසෙති. අවුරුදු 5 හා අවුරුදු 5 ට අඩු ජනගහනය 638 ක්ද , අවුරුදු 6 ත් 18 ත් අතර ජනගහනය 1834 ක්ද, අවුරුදු 19 ක් 60 ත් අතර ජනගහනය 3847 ක්ද අවුරුදු 60 ට වැඩි ජනගහනය 4960 ක්ද මෙහි වාසය කරනු ලබති.

සේවා නියුක්තිය පිලිබදව සලකා බැලිමේ දි රාජ්‍ය අංශයේ සේවය කරනු ලබන්නන් 212 ක්ද , අර්ධ රාජ්‍ය අංශයේ 792 ක්ද, පෞද්ගලික අංශයේ 1462 ක්ද, කාර්මික අංශයේ 402 ක්ද, සේවා අංශයේ 514 ක්ද, ස්වං රැකියා කරනු ලබන්නන් 540 ක් පමනද, කුලි වැඩ කරන්නන් 345 ක් පමණද, විදේශ රැකියාවල නියුතු අය 60 ක් පමණද, ආර්ධ කාලීන රැකියා කරනු ලබ නඅය 151 ක් පමණද සරණංකර වසමේ ජිවත් වෙති.

සරණංකර වසම තුල පවතින රාජ්‍ය ආයතන වනුයේ සරණංකර උප තැපැල් කාර්යාලය, සරණංකර වසමේ පිහිටි පොලිස් මුර පොල, සරණංකර යශෝධරා මාවතේ පෙර පාසැල, සරණංකර ග්‍රාම නිලධාරි කාර්යාලය, සරණංකර ළමා පුස්තකාලය ද වේ. ජෙෆසන් , විවෝ, ග්‍රැන්ඩ් රෙසිඩන්සි යනුවෙන් නිවාස සංකිර්ණ කිහිපයක් ද සරණංකර වසම තුල පිහිටා ඇත. ඒවා තුල වසන ජනවර්ග අතර මුස්ලිම්වරු සහ මැලේවරු බර්ගවරු, ඉන්දියානු සම්භවයක් සහිත ජනයා හා සුළු වශයෙන් සිංහල ජනයාද වෙසෙති.

නිවාස 1259 ක් පමණ ද, මෙම වසම තුල පවති. භාතිය මාවත ආශ්‍රිතව හා විමලසාර හා බණ්ඩාරානායක මාවත ආශ්‍රිතව හා ශ්‍රී මහා විහාර මාවත ආශ්‍රිතව අඩු ආදායම් ලාභින් වෙසෙන වතු ජනාවාස පවති. ඒවායේ ජිවත් වන බහුතරයක් ජනතාවගේ ජිවිකාව වනුයේ එදිනෙදා කුලි වැඩ සහ දෛනික වැටුප් ලබන සනයේ රැකියාවන්ය.

විහාර මාවත ඔස්සේ විමලසාර පාර, බණ්ඩාරානායක මාවතල නෙළුම් මාවත හරහා ගලා බසින ඇල මාර්ග පද්ධතිය මිනිසුන් විසින් එක් කරනු ලබන අප ජලය හා විවිධ අපද්‍රව්‍යන් නිසා විෂ වායු නිෂ්පාදනය වි මේ වෙන විට දූෂිත තත්ත්වයක පවති. මෙය ප්‍රබල පරිසර ගැටළුවකි.

මිශ්‍ර ජන සංස්කෘතියක් දක්නට ලැබෙන මෙම වසම තුල පාරම්පාරික මුල් පදිංචි කරුවන්ට වඩා බහු විධ හේතු සාධක මත ආගමනය වු ප්‍රජා කොටස් බහුලය. සිංහල, දමිළ. මුස්ලිම්, මැලේවරුන් හා වෙනත් ජාතින්ද වසම තුල සහජිවනයෙන් යුක්තව ජිවත් වෙති. වතු ආශ්‍රිතව ළමුන්ගේ විභාග සමත්විමේ ප්‍රතිශතය අවම මට්ටමක පවති. සරණංකර වසම තුල වෙන් වෙන් වශයෙන් අවධානය යොමු කල යුතු අංශ ගණනාවක් පවති. ක්‍රමවත් සහභාගිත්ව සංවර්ධන සැලසුමක් යටතේ වසම තුල ගොඩනැංවිය යුතු ප්‍රධාන සැලසුම් කෙරෙහි අවධානය යොමු කිරිම අත්‍යවශ්‍යවේ.

## 02.සරණංකර වසමේ සිතියම



## 03.යටිතල පහසුකම් සංවර්ධන සැලැස්ම

### හැඳින්වීම

ඒදිනෙදා ජන ජීවිතය වඩා සුවදායිව සහ සුමටව ගලා යැමට ශක්තිමත් හා තිරසාර අන්දමින් යටිතල පහසුකම් හි සංවර්ධනයක් හා එවැනි සංවර්ධන සැලසුමක් ක්‍රියාත්මක කිරීමට ඵලදායි නිලධාරි කණ්ඩායමක්ද සිටිය යුතු වීම අත්‍යවශ්‍යය.

යටිතල පහසුකම් සංවර්ධනය පාලම්, බොක්කු, කානු , පැති කානු , පැති බැම්, ඇලවේලි සංවර්ධනය පමනක්ම නොවේ. වැසිකිලි කැසිකිලි සංවර්ධනය ජලනල පද්ධතිය නවීකරණය, අපජල පද්ධතිය නවීකරණය හා රෝහල නවීකරණය හා අළුතින් සෑදීම, පාසැල් හා පෙර පාසැල් ඉදිකිරීම මාතෘ සායන ඉදිකිරීම, පුස්තකාල ගොඩනැංවීම, ගමට සේවා පියසවල් ඉදිකිරීම, සතිපොලවල් ඉදිකිරීම, කඩමණ්ඩි නවීකරණය වැනි අයිතමයන් ද මෙයට අත්වේ.

යටිතල පහසුකම් සංවර්ධනය වූ කලී ක්‍රමවත් හා විධිමත් සක්‍යතා අධ්‍යයනයකින් පසුව රාජ්‍ය නිලධාරින් ගණනාවකගේ සාමුහික කැපවීමකින් විධිමත් සැලසුමකට අනුව බහු විධ ප්‍රවේශයක් ඔස්සේ ගොඩ නංවාලිය යුතු විෂය පථයකි. එය නිබඳවම ජන ජීවිතය ඉහල නංවාලීමට මහෝපකාරී වන්නකි.

### යටිතල පහසුකම් සංවර්ධනය  සඳහා වන සැලැස්ම

**ගැටළුව :**

මාර්ග පද්ධතින් හි පවතින අක්‍රමවත් බව හා දුර්වල තාවයන් නිසා වාහන ගමනාගමනය මෙන්ම පදිකයන් ඔබ මොබ යාමේ දි ඇති වන ප්‍රමාද වීම් හා දුෂ්කරතාවයන්.

**අරමුණ -**

ඉහළ ප්‍රමිතියකින් යුත් දිගු කාලින හා තිරසාර පැවැත්මක් සහිත මාර්ග පද්ධතියක් සැකසීම හා පදිකයන්ට ගමනාගමනය පහසුකරවීම

**උපාය මාර්ග :**

තාක්ෂණික නිලධාරින්ගේ ක්‍රමවත් ඉංජිනේරුමය ශිල්පීය ක්‍රම ඔස්සේ සංවර්ධන නිලධාරින්ගේ ද අධීක්ෂණය මත නිබඳවම සුපරීක්ෂණයට ලක් කර ක්ෂෙත්‍රයට උචිත සැලසුම් ක්‍රම භාවිතා කරමින්  යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උපාය මාර්ගයයි.

**ක්‍රියාකාරකම් :**

1. හත්බෝධිය පාර අංක 19/9 නිවස අසල සිට සරණංකර පාරට භුගත කානුවක් ඉදිකිරීම. දිග මීටර් 70 යි. ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 20 යි. ප්‍රතිලාභී පවුල්  50 යි.
2. සරණංකර පෙදෙසේ අංක 73/1 සිට ආරම්භ වන වැසි ජල කානුව U හැඩයට කොන්ක්‍රීට් කිරීම. ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 10 යි. ප්‍රතිලාභී පවුල් 10 යි.

3 යසෝධාර මාවත අංක 30ඒ නිවස අසල සිට අංක 56 දක්වා ඇති කානුව නැවත ඉදිකිරීම. දිග මීටර් 70 යි. ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 7 යි. ප්‍රතිලාභී පවුල් 40 යි.

4 යසෝධරා මාවතේ අංක 56 සිට ගුණලාංකාර මාවතේ අංක 99 දක්වා දිවෙන වැසි ජල කානුව ජලය බැස යන පරිදි යෝග්‍ය පරිදි ප්‍රතිසංස්කරණය කිරීම. දිග අඩි 60 ය. ප්‍රතිලාභී පවුල් 40 යි .ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 7 යි.

5 රාහුල මාවතේ අබලන්ව ඇති කානු පද්ධතියේ කොන්ක්‍රිට් සැලැබ් යොදා සංවර්ධනය කිරීම. දිග මීටර් 40 යි. ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 7 යි. ප්‍රතිලාභී පවුල් 50යි.

6 විමලසාර පාර , සුදර්ශනාරාම විහාරස්ථානය අසල සිට පාලම දක්වා ඇති කොටස තාර දමා සංවර්ධනය කිරීම. දිග මීටර් 350 යි ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 12 යි. ප්‍රතිලාභී පවුල් 120 යි .

7 විමලසාර ඇල හරස් පාර සම්පූර්ණයෙන්ම තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම හා දිගින් මීටර් 200 ක් හා පළලින් මීටර් 3 ක්වූ එහි ඇති කාණු පද්ධතිය මට්ටම් කර සංවර්ධන කිරීම. ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 12 යි.

8 බණ්ඩාරනායක මාවතේ අංක 4 සිට අංක 110 බි දක්වා කොටස කාපට් කිරීම. දිග මීටර් 350 යි. පළල මීටර් 6.5 යි. ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 25 යි. ප්‍රතිලාභී පවුල් 100 යි.

9 සරණංකර ටෙරන්ස් තාර දමා සංවර්ධන කිරීම දිග මීටර් 140 යි. පළල මීටර් 4 යි. ඇස්තමේන්තු මුදල ලක්ෂ 10 යි .

10 විහාර මාවතේ අබලන්ව ඇති පාලම ප්‍රතිසංස්කරණය කිරීම දිග මීටර් 25 යි පළල මීටර් 4.5 යි ඇස්තමේන්තු මුදල ලක්ෂ 80 යි.

11 විමලසාර පාරේ පොදු නාන ළිඳ සහ පොදු වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 3 යි .ප්‍රතිලාභී පවුල් 50 යි .

## 04.වැසිකිළි හා අපජල පද්ධතිය නවීකරණය

**ගැටළුව**-01 :

සරණංකර වසමේ වතු ආශ්‍රිතව අබලන්ව ඇති වැසිකිළි පද්ධතිය නිසා මිනිසුන්ට පැන නගින දුෂ්කරතා බහුල වීම.මෙම හේතුව නිසා බෝවන රෝග වැළඳීමේ සෞඛ්‍ය තර්ජනයන්ද මතුව පවතී.

**අරමුණ :**

දිගු කාලීන කල් පැවැත්මක් සහිත ක්‍රමවත් වැසිකිළි පද්ධතියක් සාදා දීම තුලින් ඔවුන්ගේ යටිතල පහසුකම් වැඩි දියුණු කර බෝවන රෝග වලක්වා ලීම.

**උපාය මාර්ග :**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලේ සමෘද්ධි අංශයේ හෝ සැලසුම් අංශයට ලැබෙන ප්‍රතිපාදන ඔස්සේ තාක්ෂණික මග පෙන්වීම මත පැරණි වැසිකිළි පද්ධති නවීකරණය කිරීම හෝ ඉදිකරදීම.

**ක්‍රියාකාරකම් :**

භාතිය මාවත, ශ්‍රී මහා විහාර පාර 72 වත්ත, විමලසාර පාර ඇල ඉවුර හරස් පාර, බණ්ඩාරනායක මාවතේ අබලන් වු වැසිකිළි පද්ධතින් අළුතින් ඉදිකර දීම හෝ නවීකරණය කිරීම

ප්‍රතිලාභීන් 28 යි

ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 20 යි.

**ගැටළු 2**

සරණංකර වසමේ භාතිය මාවතේ අඩු ආදායම් ලාභි නිවාස යෝජනා ක්‍රමයේ අබලන්ව ගිය මලාපවහන පද්ධතිය නිසා මතුවන සෞඛ්‍ය තර්ජන හේතුවෙන් ප්‍රජාව කායික හා මානසික අපහසුතාවයන්ට ලක් ව තිබීම ප්‍රබල ගැටළුවකි.

**අරමුණ :**

භාතිය මාවත අඩු ආදායම් ලාභි නිවාස යෝජනා ක්‍රමයේ නිවාස ලාභින්ගේ අක්‍රමවත් මලනල පද්ධතිය තිරසාරව සංවර්ධනය කර ප්‍රජාවගේ කායික මානසික දුෂ්කරතා දුරලීම .

**උපාය මාර්ගය :**

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ඉංජිනේරුවන්ගේ ඉංජිනේරුමය ක්‍රම ශිල්ප වේදය ඔස්සේ අබලන් වී ඇති අපජල පද්ධතිය තිරසාරව ස්ථාපිත කරවීම.

**ක්‍රියාකාරකම :**

භාතිය මාවත අඩු ආදායම් ලාභි නිවාස යෝජනා ක්‍රමයේ අබලන් වී ඇති මලනල පද්ධතිය පිලිසකර කිරිම.

**වියදම** රුපියල් ලක්‍ෂ 50 යි

**කාලය** වසර 1 යි

**ප්‍රතිලාභි** පවුල් 300 යි

**වගකිම** ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දෙහිවල.

## 05.බහුකාර්ය සේවා පියසක් ස්ථාපිත කිරිම

රාජ්‍ය නිලධාරින් සදහා නියමිත ස්ථිර ස්ථානයක් නොමැති නිසා පොදුවේ දුෂ්කරතා රැසකට මුහුණ පැමට ලැබිම. එය රාජ්‍ය යාන්ත්‍රණය අකාර්යක්ෂම කරවන්නකි.

**අරමුණ :**

රාජ්‍ය නිලධාරින්ට හා සේවා ලාභින්ට එකම ස්ථානයකින් සේවාවන් සලසා ගැනිම උදෙස් ඒකාබද්ධ රාජ්‍ය යාන්ත්‍රණයක සහිතව ජනතාවාදි සේවාවක් තිළින කර දිම.

**උපාය මාර්ගය :**

වසමේ සියලුම නිලධාරින්ට කාර්යක්‍ෂමව ජනතාව වෙනුවෙන් සේවාවක් ලබා දිමට උපරිම අවකාශ සැපයිම

**ක්‍රියාකාරකම :**

යශෝධරා මාවතේ ළමා ක්‍රිඩා පිටියේ ප්‍රජා ශාලාවක්, ළමා හා මාතෘ සායනයක්, ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්, ග්‍රාම නිලධාරි කාර්යාලයක්, සංවර්ධන නිලධාරින්ට වසම් කාර්යාලයක්' ශ්‍රවණාගාරයක් ස්ථාපිත කර දිම .

**කාලය** වසර 1 යි.

**වියදම** රුපියල් ලක්‍ෂ 150 යි.

**වගකිම** මහ නගර සභාව, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය

**ප්‍රතිලාභි** පවුල් 500 යි.

## 06.සමාජ සංවර්ධන සැලැස්ම

සමාජ සංථාව වු කලී ව්‍යුහාත්මකව සංකිර්ණ වු ආර්ථික සංස්ථාව, ආගමික සංස්ථාව, පවුල් සංස්ථාව, අධ්‍යාපන සංස්ථාවල දේශපාලන සංස්ථාව හා එකිනෙක බැදි පවතින්නකි.
සමාජ සංවර්ධනයේ දි ළමයින්, යෞවනයන්, වියපත් ප්‍රජාව රැකබලා ගැනිම සහ සුරක්ෂිත කිරිම කාලීන අවශ්‍යතාවයක්ව පවති.
සමාජ සංවර්ධනය වු කලි පොදු සාමුහික කටයුත්තකි. එය සමාජ සජිවිකාරකයන්ට හා සමාජ ශෝධකයන්ට මෙන්ම සමාජ සංවර්ධන සැලසුම්කරුවන්ට විෂය වන්නකි. නුතනයේ සංකිර්ණ සමාජයක් නිර්මාණය වී ඇත්තේ මානවයාගෙ සංකිර්ණ ජිවන රටාවක් හා අසීමාන්තික පරිභෝජන රටාවන් ඔස්සේය.
සමාජ සාරධර්ම සමග බැදි පවතින සමාජ විනය රහිත වු සමාජ සංවර්ධනයකින් රටකට මෙන්ම ගමකට ද පලක් නැත.

**ගැටළුව**

බිදුනු පවුල් වන බලපෑම මත විවිධ ආතතිය තත්ත්වයන් වලට වතු ආශ්‍රිත දරුවන් ගොදුරුව ඇත. මේ නිසා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල විම ගැටළුවකි.

**අරමුණ**

මානසික කම්පනයට හා පිඩනයට ලක්වු දරුවන්ගේ ආතතිමය තත්ත්වයන් දුරුකර ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල දැමීම.

**උපාය මාර්ගය**

බිදුනු පවුල්වල විවාහක යුවලවල් සමගි කරවිමට මනෝ වෛද්‍ය සායන වලට යොමු කිරිම.

**ක්‍රියාකාරකම්**

බිදුනු පවුල් වල විවාහක යුවලවල් සමගි කර ඔවුන් සදහා දරුවන් වෙනුවෙන් මනෝ විද්‍යා උපදේශන ක්‍රමානුකුලව ක්‍රියාත්මක කල යුතුය.

## 07.මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නිවාරණය

**ගැටළුව**

සරණංකර වසමේ තරුණයන් හා ඇතැම් වියපත් වැඩිහිටි ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතය සදහා දැඩි සේ නැඹුරු විම.

**අරමුණ**

තරුණයන් හා වියපත් වැඩිහිටියන් මතින් තොර ජිවන රටාවකට යොමු කරවිම.

**උපාය මාර්ගය**

මත්ද්‍රව්‍ය අනිසි භාවිතයේ දුර්විපාක ඉහත ප්‍රජාවන් අතර ප්‍රබලව සංනිවේදනය කර උපක්‍රමිකව මත්ද්‍රව්‍ය භාවිතයෙන් ගලවා ගැනිම.

**ක්‍රියාකාරකම්**

1 අන්තරායාකර ඖෂධ පාලක මණ්ඩලය හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් පවත්වනු ලබන ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටයන් ඉලක්ක ප්‍රජාව වෙත රැගෙන යාම.

2 අක්‍රිය සිවිල් ආරක්ෂක කමිටුව බලගැන්වීම

3 අවධානම් පවුල්වල යෞවනයන් තරුණයන් යහපත් සමාජ ක්‍රියාකාරම් වලට යොදවා ගැනිම.

4 මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් දයාවෙන් යුතුව සුමගට ගැනිම සහ ආකල්පමය වෙනසක් ඇති කිරිම.

5 මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරින්, ප්‍රජා නායකයින්, ප්‍රජා පොලිසිය, ග්‍රාම නිලධාරි සහ සංවර්ධන නිලධාරින් මත්ද්‍රව්‍ය භාවිතයේ දූර්විපාක මතුකර පෙන්වන විඩියෝ පට පොත් පිංචවල් සහ පත්‍රිකා ඉලක්ක ප්‍රජාව වෙත සංප්‍රේශනය කරවිම.

## 08.දරුවන්ගේ අධ්‍යාපන ගැටළු

**ගැටළුව :**

වතු ආශ්‍රිතව දරුවන් කඩඉම් විභාග අසමත් විම මත හුදකලා ජිවිත ගත කිරිම හා අනාගත අවිනිශ්චිත තත්ත්වයකට පත්විම ප්‍රබල ගැටළුවක්ව පවති.
විශේෂයෙන් ඉංග්‍රිසි ගණිතය හා විද්‍යාව යන විෂයන් අ.පො,ස. (සාමාන්‍ය පෙල) දරුවන් අසමත් වන බව පෙනි යයි. වතු ආශ්‍රිත දරුවන් සාමාන්‍ය පෙල අසමත් විම ප්‍රතිශතය ඉහල යාම මත උසස් පෙල විභාගය නොලියාම අතරමගදි අතහැර යාම ගැටළුවකි

**අරමුණ :**

දරුවන්ගේ අධ්‍යාපන ජයග්‍රණය උදෙසා ඔවුන් යොමුකර උසස් අනාගතයකට මංපෙත් විවර කර දිම.

**උපාය මාර්ගය :**

විභාගය අසමත් විමෙන් වන හානිය දරුවන්ට කියා දි ආකල්පමය වෙනසක් ඔවුන් විභාග මානසිකත්වයට අන්තර්ග්‍රහනය කරවිම.

**ක්‍රියා කාරකම් :**

1 විභාග වැඩමුළු සංවිධානය කර සුදුසු ආචාර්ය වරුන් ගෙන්වා දිලිදු දරුවන්ට නොමිලේ අදාල සැසි පැවැත්විම

2 මුද්‍රිත පොත්, සි ඩි, මාර්ග ගත ක්‍රම මගින් දරුවන්ට ක්‍රියාකාරිව විෂය කරුණු පුනරික්ෂණය කර දිම

3 දෙමාපියන් විදෙස්ගත වි ඇත්නම් දරුවන් සුදුසු භාරකරුවන් හට යොමු කර ඔවුන්ට මාර්ග උපදෙස් සේවා ලබා දිම

**ප්‍රතිලාභින්** 300 යි .

**කාලය** වසර 1 යි .

**වගකීම** උපදේශ සේවා නිලධාරින්, සංවර්ධන නිලධාරින්. ළමාරක්ෂණ නිලධාරින්

**ගැටළුව**

යෞවනයන් හ වැඩිහිටියන් අතර බෝ නොවන රෝග බහුල විම ගැටළුවකි.යෞවනයේ පටන් වියපත් වැඩිහිටියා දක්වා ශාරීරික ක්‍රියාකාරකම් අද වන විට සීමා වි ඇත. මෙය බෝ නොවන රෝග ව්‍යාප්තියට පදනමක් වි ඇත.

**අරමුණ :**
බල ප්‍රදේශයක් නිරෝගිමත් බෝ නොවන රෝග වලින් තොර සෞඛ්‍ය සම්පන්න තරුණ වැඩිහිටි ප්‍රජාවක් ඇති කිරිම.

**උපාය මාර්ගය**
ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ක්‍රිඩා සංවර්ධන නිලධාරි, තරුණ සේවා නිලධාරි හරහා යෞවන හා වියපත් වැඩිහිටියන් වෙන් වෙන්ව ඔවුන් ශාරීරික යෝගත්‍යනාවය අනුව සුදුසු ශාරීරික ක්‍රියාකාරකම් වලට යොමු කිරවිම.

**ක්‍රියාකාරකම් :**

1. ක්‍රිඩා සමිති, යොවුන් සමාජ, යෞවන සමිති බලගන්වා යාවත්කාලින කිරිම
2. මානසික සමබරතාවය සහ මානසික ඒකාග්‍රතාවය ඇති කරණ ස්වායු හා නිර්වායු ව්‍යායාම් ක්‍රම යෝග භාවනා ක්‍රම සදහා ප්‍රජාව යොමු කරවිම.
3. පෝෂණවේදින් හා ක්‍රිඩා උපදේශකවරුන් හරහා වැරදි ආහාර රටා හේතුවෙන් ද බෝ නොවන රෝග හට ගන්නා බව හුවා දැක්විමට අධ්‍යාපනික විඩියෝපට හා වැඩමුළු ජනතාව වෙත ප්‍රවේශ කර විම.
4. ශාරීරික යෝග්‍යතාවය ඉහල නංවාලිමට සුදුසු අතුරු ආබාධ පැන නොනගින ව්‍යායාම් උපකරණ ලබා දිම.

කාලය වසර 1 යි.
වගකිම : ක්‍රිඩා නිලධාරින්, පෝෂණ වේදින් , ප්‍රජා වෛද්‍ය නිලධාරින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් දෙහිවල

## 09.පදිංචි ඔප්පු සම්බන්ධ ගැටළු

**ගැටළුව**

විමලසාර පාර ගෙවල් 100 ආශ්‍රිතව සහ බණ්ඩාරනායක මාවතේ නිවැසියන්ට හාතිය මාවතේ අඩු ආදායම් ලාභි නිවැසියන්ට නිත්‍යානුකුල ඔප්පු නොමැතිවිම.
ඉහත වතු ආශ්‍රිතව ජිවත් වන ජන ප්‍රජාවගෙන් 90% කට වඩා නිත්‍යානුකුල ඔප්පුවක් නොමැත. හාතිය මාවතේ අඩු ආදායම් ලාභි නිවාස යෝජනා ක්‍රමයේ නිවාස 300 ක පමණ මිනිසුන් වරිපනම් ගෙවනුයේ එක් අයෙකුගේ නමිනි. මෙය ප්‍රබල ගැටළුවකි. මෙය වහාම නිරවුල් කල යුතුයි.

**අරමුණ**

වතු ආශ්‍රිතව ජිවත් වන නිත්‍යානුකුල ඔප්පු නොමැති ප්‍රජාවට නිත්‍යානුකුලව ඔප්පු ලබා දි ඔවුන් පත්ව ඇති අවාසි තත්ත්වය දුරලිම .

**උපාය මාර්ගය**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා නගර සභාවේ ඉඩම් සංවර්ධන නිලධාරින් ලවා අදාල ගැටලුවලට විසදුම් ලබා ගැනිම

**ක්‍රියාකාරකම්**

නගර සභාවේ සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දෙහිවල ඔප්පු නොමැති ප්‍රජාවගේ කඩිනම් ලැයිස්තුවක් ලැයිස්තු ගත කර ඔවුන් අයත් භුමි ප්‍රදේශයේ බාරකාරත්වය පවතින ආයතන හදුනා ගැනිම සහ ඒ ආයතන හරහා ඔවුන්ට නිත්‍යානුකුලව ඔප්පු ලබ ාදි කඩිනම් ක්‍රමවේදයක් සකස් කිරිම.

**කාලය** මාස 6 යි.

**වගකීම** දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව , දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉඩම් සංවර්ධන නිලධාරින්

## 10.ළමා පෝෂණය හා සෞඛ්‍යය

**ගැටළුව**

වතු ආශ්‍රිත ජනතාව දරිද්‍රතාවය හා  නොදැනුවත් කම මත හා නුගත් කම යන සාධකයද පවතින හෙයින් අඩු බර සහිත දරුවන්ගේ වර්ධන ගැටළු මතුවිම.

**අරමුණ**

ප්‍රශස්ත බරකින් යුක්තව මනාව වර්ධනය වු ළමා ප්‍රජාවක් බිහි කරලිම .

**උපාය මාර්ගය :**

පවුල් සෞඛ්‍ය හා ප්‍රජා වෛද්‍ය නිලධාරින් හරහා යෝග්‍ය වැඩසටහන් පැවැත්විම

**ක්‍රියාකාරකම් :**

1 දිළිදු ජනයා ආර්ථික වශයෙන් බලගැනිවිමේ වැඩසටහන් පවත්වා ඔවුන්ගේ ක්‍රය ශක්තිය හෙවත් මිළ දි ගැනිමේ හැකියාව වර්ධනය කිරිම.

2 නොමේරු දරුවන් සහ අඩු බර සහිත දරුවන් නියමිත පරිදි සායනවලට සහභාගි කරවා ගැනිම.

3 නිරක්තියෙන් දුපොෂණයෙන් හා පණු ආසාදනයෙන්  පෙලෙන මව් වරුන්ට සුදුසු පෝෂණ අතිරේක හා ඖෂධ වර්ග ලබා දිම .

4 දිගු කාලින පෝෂණවේදි වැඩසටහන් සහ මව්වරුන් හා දරුවන් අඛණ්ඩව පසු විපරම් කර දෙපාර්ශවයේම පෝෂණය මනා ලෙස ඉහල නැංවිම.

**කාලය** වසර 1 යි

**වගකිම** ක්‍රිඩා නිලධාරින්. පවුල් සෞඛ්‍ය නිලධාරින් හා පොෂණවේදින්

## 11.ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය

**ගැටළුව**

වතු ආශ්‍රිතව ජීවත්වන කාන්තාවන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු විම
මේ නිසා නිරන්තරයෙන් කාන්තාව පුරුෂයාගේ අඩන්තෙට්ටම් වලට හා පහර දිම් වලට හා බිය වැද්දීම්, නොසලකා හැරීම්වලට මර්ධනයට යටත්ව ජීවත් විමට සිදුවිම ප්‍රබල ඛේදවාචකයකි.

**අරමුණ :**

කාන්තාව ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් මුදවා සාමකාමි පවුල් පරිසරයක් කුඩිම්බිය තුල ඇති කිරිම

**උපාය මාර්ගය**

ස්වාමිපුරුෂයා සඳහා මනෝ උපදේශන වැඩසටහන්, උපදේශකයන් ලබා ක්‍රියාත්මක කිරිම තුලින් පවුලේ සාමකාමි වාතාවරණයක් ගොඩ නැංවිම.

**ක්‍රියාකාරකම්**

1 ස්වාමිපුරුෂයාට ක්‍රමවත්ව අඛණ්ඩව මනෝ උපදේශන මාලාවක් සඳහා යොමු කරවිම.

2 ගැටළුව ඇත්තේ කොතනැදැයි පෙර විපරමක් සිදුකර ගැටළු කාන්තාවගේ වාචික සංනිවේදනයේ ගැටළු නිසා ඇති වේ නම් කාන්තාව සඳහා වාග් සංවර යෝග අභ්‍යාස වල යොමු කරවිම හෝ භාවනා වෙත යොමු කරවිම.

3 ගෘහස්ථ ප්‍රචන්ඩත්වය මැඩ පැවැත්විය නොහැකි අවස්ථාවල නිතියේ පිලිසරණ කාන්තාව වෙත ප්‍රබලව ලබා දි පුරුෂයා අඩපණ කිරිම

4 ගෘහස්ථ ප්‍රචන්ඩත්වය පැන නගින ප්‍රාථමික මුලයන් සොයා බලා ඒවා සිඳ දමා දෙදෙනාම වෙන වෙනම කැඳවා සුදුසු ක්‍රමවේදන් අනුගමනය කිරිම.

**වගකීම** : මනෝ උපදේශණ නිලධාරින්, වනිතා සංවර්ධන නිලධාරින්
**කාලය** වසර 1 යි

## 12.පරිසර කළමණාකරණය හා ආපදා කළමණාකරන සැලැස්ම

**ගැටළුව**

නියමිත පරිදි නියමිත දිනට මහ නගර සභාව විසින් කැලි කසල රැගෙන නොයැම .
ප්‍රජාවගේ කැලි කසල විධිමත්ව රැගෙන නොයාමත් මහ නගර සභාව විසින් කම්කරුවන් හා කානු කණ්ඩායම් නිසි පිරිදි නොයෙදිමත්, වගකිම් පැහැර හැරිමත් ප්‍රබල ගැටළුවකි. ඒ නිසා විශේෂයෙන්ම රැකියාවල නියුතු ජනතාව කසල මලු බාහිරව තැබිමත් ඒවා සතුන් විසින් අවුස්සා දැම්මෙන් ඇතිවන ගැටළුකාරි තත්ත්වය වි පවති.

**අරමුණ :**

විධිමත්ව කසල ප්‍රවාහනය කිරිමේ සැලැස්මක් ඇති කර පුරවැසියාගේ ගැටළු අවම කිරිම.

උපාය මාර්ගය

කසල ප්‍රවාහන සැලැස්මක් විධිමත්ව ඇති කරලිම

**ක්‍රියාකාර කම්**

1 කොට්ඨාශයට අදාල ප්‍රජා කමිටු පත් කර වීදියෙන් වීදියට ප්‍රජා කමිටු නායකයින් පත්කර යෝග්‍ය දිකු කාලින සැලස්මක් ක්‍රියාත්මක කරවිම

2 නගර සභාවේ සේවකයා සහ ජනතාව අතර කැලි කසල රැගෙන යාමේ දින පිලිබදව මනා වු සංනිවේදන ක්‍රම වේදයක සැකසිම

3 නගර සභාවේ ප්‍රවාහන රථ සහ ප්‍රවාහන රථ පහසුකම් පුළුල් කිරිම

**කාලය** : දිනපතා

**වගකීම** : ප්‍රජා සහ පරිසර පොලිසිය කොහුවල ප්‍රජා සංවර්ධන හා පවිත්‍රතා නිලධාරින් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

## 13.ගංවතුරමය ආපදා තත්ත්වය

ගැටළුව

කොටි වර්ෂාවකදි වුවද ක්‍රීඩා මාවත, සරණංකර පාර , හාතිය මාවත, ශ්‍රි මහා විහාර පාර යට වි ගංවතුර ඇති විමේ ප්‍රවණතාවයක් හට ගැනිම මත ජන පීවිතය අඩපණ විම

අරමුණ

වර්ෂා ජලය විධිමත්ව බැසයන අයුරින් සුදුසු ක්‍රමවේදයක් සකස් කර ගංවතුරමය තත්ත්වය පාලනය කර ජන පීවිතය යථාවත් කිරිම

උපාය මාර්ග

1 අවිචාරවත් නාගරිකරණය බැහැර කර පරිසර හිතකාමි නාගරිකරණ ක්‍රම වේදයක් අනුගමනය කිරිම

2 සරණංකර ප්‍රදේශය වටා ගලා බසින ඇල මාර්ග පද්ධතිය බැකෝ යොදා ශුද්ධ පවිත්‍ර කර රොන් මඩ ඉවත් කර වැසි ජලය ක්‍රමවත්ව ගලා බසින ලෙස සැලසිම

**ක්‍රියාකාරකම්**

1 සරණංකර ග්‍රාම නිළධාරි වසමට අයත් මුං ඇට බොක්කුව ප්‍රතිසංස්කරණ කිරිම

2 ක්‍රීඩා මාවතේ අංක 15 සිට 20 දක්වා මතුපිට කාණු පද්ධතිය පුළුල් කර ක්‍රීඩාංගණය මායිමෙන් ඇල මාර්ගය දක්වා කානු පද්ධතිය ඉදිකිරිම

දිග මිටර් 100 පළල අඩි 2 යි කාලය වසර 1 යි වගකිම මහ නගර සභාව දෙහිවල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දෙහිවල තාක්ෂණික නිලධාරින්

ප්‍රතිලාභින් 100 යි .

3 ක්‍රීඩා මාවතේ අංක 29 සිට 32 දක්වා බලපාන කානුව උතුරා නිවෙස් වලට ගැලීමට පිලියමක් ලෙස සිටි හයි ස්කූල් අසල ඇති ගලි පද්ධතිය නවීකරණය කර එය ප්‍රධාන ඇලට සම්බන්ධ කිරීම
ප්‍රතිලාභීන් 60 වගකීම දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

4 ශ්‍රී මහා විහාර පාරේ ට්‍රාන්ස්පෝර්මය අසල ඇති කුඩා ඇල මාර්ගයේ කළුගල් බැම් ඉදිකිරීම
වියදම රුපියල් ලක්ෂ 80 දිග මීටර් 250 පළල මීටර් 2.5 යි

5 භාතිය මාවතේ අඩු ආදායම් ලාභි නිවාස යෝජනා ක්‍රමයේ අඩක් නිම කර ඇති පැති බැම්ම නිම කිරීම
වියදම රුපියල් ලක්ෂ 15 යි. දිග මීටර් 150 යි කාලය වසර 1 යි
ප්‍රතිලාභීන් 300 යි වගකීම දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දෙහිවල ගල්කිස්ස මම නගර සභාව

සරණංකර වසමට බලපාන හදුනාගෙන ඇති සැගවුනු ආපදා තත්ත්වයක් ලෙස ක්‍රීඩා මාවතේ වැඩිහිටි නිවාසයේ පිටුපස ඇති පස් කන්ද පුපුරා තැනින් තැන නායයෑම දැක්විය හැකිය. මෙම ක්‍රියාවලින් දිර්ඝ කාලිනව සෙමින් සිදුවන ක්‍රියාවලියක් වුවද මෙයින් නිවාස 15 කට පමණ බලපෑමක් සිදුවේ. මෙම තත්ත්වයට පිලියමක් ලෙස දැනට අඩක් නිම කරන ලද පැති බැම්ම සම්පුර්ණයෙන් නිම කිරීම අත්‍යවශ්‍ය කාරණයකි.
වියදම රුපියල් ලක්ෂ 20 යි වගකීම දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව ප්‍රතිලාභීන් 50 යි කාලය වසර 1 යි

**ගැටළුව**

අවධිමත් නාගරිකරණය හා ඉදිකිරීම් නිසා පවතින පාරිසරික අසමබරතාවය හේතුවෙන් ප්‍රජාව තුල (වියපත්) නිරන්තර උනුසුම්කාරි තත්ත්වයක් ඇති වි ශාරීරික හා මානසික අපහසුතාවයන් ඇති විම.

**අරමුණ :**

වියපත් හා වැඩිහිටි ප්‍රජාව පෙලෙන උණුසුම්කාරි පාරිසරික තත්ත්වය තුලිත කර වියපත් ප්‍රජාව පාරිසරික තුලිත ජිවන රටාවකට අනුගත කිරිම

**උපාය මාර්ගය**

වියපත් අය පෙලෙනා දාහය හා අවිවේකි බව දුරලිමට සුදුසු පාරිසරික හිතකර ක්‍රමයක් ඇති කර ලිම.

**ක්‍රියකාරකම් :**

1 සරණංකර සණස බැංකුවේ කෙලවරේ සිට මුංඇට බොක්කුව තෙක් හරිත කලාපයක් පිහිටුවා වියපත් වැඩිහිටියන්ට සැදැ සමය ගත කිරීමට කිරි ගරුඬ කොන්ක්‍රිට් බංකු තනවා හරිත කලාප අංක 1 ඇති කිරිම

2 නෙළුම් මාවතේ පහල කොටසේ හරිත කලාප අංක 2 පිහිටුවා වඩා උස නොයන ශාඛ සහ බොන්සායි පැල ශාඛ පද්ධතියක් ස්ථාපිත කර කොන්ක්‍රිට් බංකු ඉදිකිරීම

**වගකීම** දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව සහ දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සහ SLDC ආයතනය

**වියදම** රුපියල් ලක්ෂ 10 යි

## 14.ඩෙංගු මදුරු උවදුර

**ගැටළුව**

නිරන්තරව පැන නගින ඩෙංගු මදුර උවදුර තුලින් ජනතාවට ගැටළුකාරි තත්ත්වයක් ඇති විම.

තාවකාලිකව ඩෙංගු උවදුර පාලනය වුවද වරින් වර කොට්ඨාශ තුල ඩෙංගු රෝගින් වාර්ථා විම ගැටළුවකි.

**අරමුණ**

ඩෙංගු මදුර උවදුර ප්‍රශස්ථව පාලනය කිරිම

**උපාය මාර්ගය**

ඩොංගු මර්දනයට සම්බන්ධ රේඛීය ආයතන හා මනා සම්බන්ධිකරණයක් තුලින් වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

**ක්‍රියාකාරකම්**

1. වසමේ විරී කම්ටු සක්‍රිය කර බල ගන්වා ප්‍රජා නායකයන් හරහා පොදු ජනතාව දැනුවත් කර වැඩ සටහන් සකස් කිරිම
2. 'ඩෙංගු අද ඔබට නම් හෙට මට විය හැකිය ' යන ආකල්පයෙන් යුතුව ප්‍රජාව සමග එක් වි පොදු ශ්‍රමදාන මාලාවක් සංවිධානය කර එම ක්‍රියාවලින සතියකට දෙවතාවක්වත් ක්‍රියාත්මක කිරිම
3. සිවිල් ආරක්ෂක කම්ටුවල සක්‍රියා දායකත්වය ඩෙංගු මර්ධන කටයුතු වලට ලබා ගැනිම
4. ඉවතලන ප්ලාස්ටික් බහාලුම් යෝගට් කොප්ප හිස් ටින් ඉවතලන ප්ලාස්ටික් කන්ටේනර් නිසි පරිදි බහා ලිම සහ ඒවා පිලිවෙලකට වර්ග කර නගර සභාව වෙත යොමු කිරිම.
5. අපද්‍රව්‍ය හා කුණු කසල ක්‍රමවත්ව බැහැර කිරිම
6. ඩෙංගු රෝගින් වෙසෙන නිවාස ආශ්‍රිත ප්‍රදේශවලට ධුමායන කටයුතු සිදු කිරිම.

## 15.ජිවන උපාය සංවර්ධන සැලැස්ම හා ව්‍යවසාය සංවර්ධන සැලැස්ම

**හැදින්විම**

නිර්මාණශිලි ආර්ථිකයක් තුල නිර්මාණශිලි ව්‍යවසාකයින්ට හිමිවන්නේ ප්‍රබල ස්ථානයකි. මෙවැනි පුද්ගලයෙකු තම දක්ෂතා හා කුසලතා තුලින් කදිම දායාදයන් රැසක් ලොවට ලබා දෙන අතරම සාර්ථක ව්‍යවසායෙකු බිහිවීම තුලින් බොහෝ පිරිසකගේ ජිවනෝපාය සංවර්ධන ක්‍රියාවලියට පුර්ණත්වයට පත් වෙ. ව්‍යවසාකයා අවදානම් දරන්නෙකි. ඔහු ලාභ හෝ පාඩු විදදරා ගන්නෙකි. සුළුවෙන් ව්‍යාපාර කටයුතු අරඹා පසුකාලිනව දැවැත්ත ව්‍යවසායකයින් වු චරිත අප අසා ඇත්තෙමු. ව්‍යවසායක ගුණාංග උපතින් ලබා ගෙන එන්නක් නොව එය මනා කැපවිමක් තුලින් වර්ධන කර ගත හැක.

**ගැටළුව**

හාතිය මාවත ,විමලසාර පාර ,බණ්ඩාරනායක පාර ආදි වතු ආශ්‍රිත පවුල් 200 කට පමන නිශ්චිත ආදායම් මාර්ගයක් නොමැති විම නිසා ආර්ථික දරිද්‍රතාවයෙන් පෙළීම

**අරමුණ**

තිරසාර ආදායම් මාර්ගයක් ජනිත කර ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්විම

**උපාය මාර්ගය**

නිර්මාණ ශිලි ව්‍යවසායකත්වය සහ ස්වං රැකියා වෙත ප්‍රජාව යොමු කරලිම

**ක්‍රියා කාරකම්**

1 ව්‍යවසායකත්ව පුහුණු සම්මන්ත්‍රණ දේශන වැඩ මුළු පැවැත්වීම
2 ස්වං රැකියා ණය යොජනා ක්‍රමයක් දියත් කිරිම
3 ඉතිරි කිරිම හා සකසුරුකම් පුරුද්ද වර්ධනය කර ග්‍රාමශක්ති වැනි සමිති ඔස්සේ ණය ලබා දිම
4 ව්‍යවසායකත්ව ගුණාංග වර්ධනය කරලිමට රාජ්‍ය ආයතනය සහ පෞද්ගලික ආයතන වල සම්පත් දායකයින් යොදා ගැනිම

**කාලය** වසර 1 යි ප්‍රතිලාභින් 75 යි

**වගකීම** : කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි, විද්‍යාතා තාක්ෂණ නිලධාරි, ව්‍යවසාය පුහුණු සංවර්ධන නිලධාරින්

**ගැටළුව 2**

නිෂ්පාදන වෙළඳ පොලක් සොයා ගැනිමේ ගැටළු මතුවිමේ සහ අලෙවි උපක්‍රම පිලිබඳ නොදැනුවත් භාවය ඇතැම් නිෂ්පාදකයින් භාණ්ඩ නිෂ්පාදනයේ යෙදි සිටියද,අලෙවි ඉව නොමැති විම මත තම නිෂ්පාදන අලෙවි කර ගැනිමට නොහැකිව ලත වේ.

**අරමුණ :**

නිෂ්පාදකයින්ට නිෂ්පාදන වෙළඳපොල සොයා දිම තුලින් නිෂ්පාදනයන් හි අලෙවි දාරිතාවය උපරිම කිරිම

**උපාය මාර්ගය**

උසස් ගණයේ නිෂ්පාදනයන් බිහි කිරිමට අවශ්‍ය මාර්ගෝපදේශයන් ලබා දිමෙන් තරගකාරි නිෂ්පාදනයන් වෙළඳ පොල වෙත ප්‍රවේශ කරවිම.

**ක්‍රියාකාරකම්**

1 ආකර්ශනිය ඇසුරුම් කරණය හා භාණ්ඩ සදහා සහනදායි වට්ටම් හා කොමිස් ලබා දිම ඇතුළු ප්‍රබල අලෙවි උපක්‍රම භාවිතා කිරිම සදහා නිෂ්පාදකයන්ට ඒ ආශ්‍රිත පුහුණු සැසි පැවැත්විම
2 අලෙවි හා බෙදා හැරිමේ උපක්‍රම නිවැරදි ස්ථානයට නිෂ්පාදකයා යොමු කිරිම ඇතුළු සාධක රැසක් පිලිබදව තාර්ථික අලෙවි ප්‍රවේශයන් උපයෝගි කිරිම උචිත වේ
3 සරණංකර පාරේ පිහිටි පැරණි වෙළඳ මධ්‍යස්ථානය නවිකරණය කර ස්වංරැකියා ලාභින් උදෙසා ස්වං අලෙවි සැල් ඇති කිරිම.

**කාලය** වසර 1 යි ප්‍රතිලාභින් 120

**වගකීම** විද්‍යාතා තාක්ෂණ නිලධාරින් , කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරින් සහ
දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

## 16.**කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම**

**හැඳින්වීම**

නාගරික බල ප්‍රදේශයක් වන සරණංකර වසම තුල නාගරික ප්‍රජාව ගෙවතු වගාවට යොමු නොවීම මත සමස්ථවයක් වශයෙන් එළවළු හා පලතුරු වෙළඳ පොලින්ම මිළ දී ගැනීමට උත්සුකවීම. මුදල් පසුබියට මෙන්ම සෞඛ්‍යයටද අහිතකර තත්ත්වයකි.

වර්තමානය වන විට ප්‍රජාව අතර හෘදයාබාධ, අධි රුධිර පීඩනය රුධිර ගත කොරොලස්ටොරෝල් සාන්ද්‍රනය ඉහල යැම වැනි බෝ නොවන රෝග ව්‍යාප්තියකද මෙය වක්‍ර සාධකයක් වී හමාරය. මේ නිසාම වසමේ ප්‍රජාව වගාවන් සඳහා අභිප්‍රේණය කිරීම සඳහා ප්‍රබල වැඩසටහන් රැසක් හඳුන්වා දිය යුතුව ඇත. මහල් නිවාස සංකීර්ණ හතරක් පමණක් ඇති බැවින් ඔවුන් සඳහා ටෙරන්ස් ගාඩ්න් හා වර්ටිකල් ගාඩ්න් යන සංකල්පයන් හඳුන්වා දීම යෝග්‍ය වේ. හයිබ්‍රිට් බීජ හා වැඩි පළදාවක් ලබා දෙන අඩු ඉඩකඩකට සුදුසු බෝග සහ පැල වර්ග හඳුන්වා දීමත් , කාබනික පොහොර භාවිතයට හුරු කරවීමත්. ගෙදර ඉවතලන අපද්‍රව්‍ය ඇසුරින් කොම්පොස් පොහොර නිපදවීමටත් ප්‍රජාව උනන්දු කරවීම වැදගත්ය. පවතින සීමිත ඉඩකඩ පවා වගාවන් සඳහා යොදවා ගත් නාගරික බල ප්‍රදේශ මෙහි පවතින නිසා ප්‍රජාව සඳහා සුදුසු මාර්ගෝපදේශනයන් ලබා දිය යුතුවේ.

**ගැටළුව 1**

නාගරික බලප්‍රදේශයන් හි ගෙවතු වගාවන්ට පවතින අවම ඉඩකඩ නිසා ගෙවතු වගාවන් සඳහා ප්‍රජාව යොමු නොවීම.

**අරමුණ**

සීමිත අවකාශයක උපරිම වගා බිමක් ස්ථාපිත කරවීමට ප්‍රජාව යොමු කර වීම.

**උපාය මාර්ග**

වගා කටයුතු සඳහා ප්‍රජාව නිරන්තරයෙන්ම දිරි ගැන්වීම.

**ක්‍රියා කාරකම්**

1. නොමිළේ බීජ වර්ග සහ පළතුරු සහ බද්ධ පැල ශාඛ ලබා දීම
2. කෙටි කාලයකින් වැඩි අස්වැන්නක් ලබා දෙන බෝග වර්ග හඳුන්වා දීම
3. රෝගවලට පරිබෝධයකයන්ට හා කර්කෂ පරිසර සාධකයන්ට ඔරොත්තු දෙන නව ප්‍රබේදයන් වර්තාමනයේ පර්යේෂමලින් පැලැටි ජාන විද්‍යාඥයින් කෘතිමව නිර්මාණය කර ඇති බැවින් මිනිසාට හිතකර වන්නාවූ එළවළු හා පළතුරු පැල හඳුන්වා දීම සිදු කළ යුතුය.
4. සරස් හා තිරස් වගාව ප්‍රචලිත කිරීම
5. බදුන් වර්ග , කාබනි, පොහොර සහ කෘෂ උපකරණ ලබා දීම

**කාලය** වසර 1 යි ප්‍රතිලාභින් 50 යි

**වගකීම** කෘෂි කර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින් , කෘෂිකර්ම සංවර්ධන නිලධාරින් ගොවිජන සේවා නිලධාරින් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරින්

## 17.නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම

**ගැටළුව 1**

වතු ආශ්‍රිත තරුණ තරුණියන් නිපුණතාවය හා කුසලතාවයන් අවම විම මත ඌන සේවා නියුක්තියෙන් පෙලිම .

**අරමුණ :**

විශේෂයෙන් මතු ආශ්‍රිතව වසමේ නිපුණතාවය අඩු තරුණ තරුණියන් හදුනා ගෙන ඔවුන්ගේ නිපුණතාවය වර්ධනය කර රැකියා වෙළද පොලට ප්‍රවේශ කරවිම .

**උපාය මාර්ගය**

නිපුණතාවය හා කුසලකාවය වර්ධනය වන පාඨමාලා සහ තරුණ තරුණියන් සම්බන්ධ කරවිම.

**ක්‍රියාකාරකම් :**

1 NVQ ඉහල මට්ටමක් ලබා ගැනිමට නුපුහුණු ශ්‍රමික පිරිස් යොමු කරවිම

2 පෞරුෂත්වය සංවර්ධනය හා ආකල්ප සංවර්ධන වැඩ සටහන් වෙත ප්‍රජාව යොමු කරවිම.

3 මෘදු කුසලතාවයන් මෙන්ම දෘඩ කුසලතාවයන් සංවර්ධනයට තරුණ තරුණියන්ට අවස්ථාව ලබා දිම

4 සරණංකර කියවිම් ශාලා ගොඩනැගිල්ලේ පහත මාලයට ස්ලැබ් එකක් දමා අළුතින් කොටසක් ඉදිකර එහි නැණසැලක් හා වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් ඇරඹිම.

**ප්‍රතිලාභින්** 100 වියදම රුපියල් ලක්ෂ 15

**වගකීම** දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, විද්‍යාතා තාක්ෂණික නිලධාරි සහ නිපුණතා සංවර්ධන නිලධාරි දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,

**ගැටළුව 2**

නිපුණතා සංවර්ධනයට සහ හැකියා වර්ධනයට අදාලව පාඨමාලාවන් වෙත තරුණ ප්‍රජාව යොමු විමේ ප්‍රවනතාවය ඉතා අවමවිම

**අරමුණ**

නිපුණතාවයෙන් හා හැකියාවෙන් පිරිපුන් තරුණ ප්‍රජාවක් සවිබල ගැන්විම

**උපාය මාර්ගය**

නිපුණතා පුහුණු මධ්‍යස්ථානයන් වෙත තරුණ ප්‍රජාව යොමු කරවිම

**ක්‍රියාකාරකම්**

1 දිළිදු තරුණ තරුණියන් සදහා නොමිළේ පවත්වනු ලබන නිපුණතා හා හැකියා වර්ධන පාඨමාලා හදුන්වා දිම

2 නවොද්පාදනයන් සදහා අවශ්‍ය නිර්මාණශිලි ගුරුවරුන්ගේ ඇසුර සහ එවැනි නිර්මාණ බිහි කිරිම අවශය ප්‍රායෝගික ක්‍රියාකාරකම් හදුන්වා දිම

**කාලය** වසර 1 ප්‍රතිලාභින් 120

**වගකීම** නිපුනතා සංවර්ධන නිලධාරි විද්‍යාතා තාක්ෂණික නිලධාරි